# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2354/18 - 2023 ඔක්තෝබර් මස 18 වැනි බදාදා - 2023.10.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඊ ව්‍යවස්ථාව සමග කියවිය යුතු 154 ඇ ව්‍යවස්ථාව යටතේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19(5) උපවගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඊ ව්‍යවස්ථාව සමග කියවිය යුතු 154 ඇ ව්‍යවස්ථාව යටතේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19(5) උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ මුදල් වැය කරමින් සිදුකරන සංවර්ධන කාර්යයන් සම්බන්ධයෙන් මුදල් වර්ෂයට අදාළ සංවර්ධන සැළසුම් සකස් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී අදාළ කරගත යුතු රීති මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී පීඑච්ඩී (ගෞරව)
එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී,
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2023 ඔක්තෝබර් මස 16 වැනි දින,
බත්තරමුල්ල, බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**රීති**

1. මෙම රීති බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළව යම් මුදල් වර්ෂයක් වෙනුවෙන් සංවර්ධන සැළසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමට අදාළවන නිර්ණායක නියම කිරීම සඳහා ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක, 2190/25 හා 2020 අගෝස්තු මස 25 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයට* ඇතුළත් බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළව සංවර්ධන සැළසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමට අදාළ රීති පරිච්ඡින්න කිරීම සඳහා ද විධිවිධාන සැලසීම පිණිස පනවනු ලැබේ.

2. මෙම රීති 2023 අංක 01 දරන බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ සංවර්ධන සැළසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමට අදාළ රීති ලෙස හැඳින්වේ.

3. බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළව මුදල් වර්ෂයක් වෙනුවෙන් වාර්ෂික සංවර්ධන සැළැස්ම හා ක්‍රියාත්මක සැළැස්ම සකස් කිරීමේ දී බස්නාහිර පළාතේ එක් එක් පළාත් අමාත්‍යාංශය විසින් පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූල වෙමින් ක්‍රියාකළ යුතු බවට මෙයින් නියම කරමි.

(1) බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ වාර්ෂික සංවර්ධන සැළසුම් සකස් කිරීමේ දී ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව බස්නාහිර පළාත සඳහා සංවර්ධන යෝජනා සැළකිල්ලට ගත යුතුය.

(2) මධ්‍යකාලීන ආංශික ප්‍රතිඵල රාමුව තුළ දැනටමත් හඳුනාගෙන ඇති ප්‍රමුඛ පරාස, තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සාක්ෂාත් වන අයුරින් සංවර්ධන සැලැස්ම සකස් කළ යුතුය.

(3) සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී එම ව්‍යාපෘති ද්විකරණය වීම වළක්වාලීමට අමාත්‍යාංශ විෂය පථයට සෘජුවම අයත් වන ව්‍යාපෘති සඳහා සැලසුම් සකස් කිරීම කෙරෙහි අවධානය යොමු විය යුතුය. මෙහිදී ව්‍යාපෘති බලධාරීත්වය හා ක්‍රියාත්මක බලධාරීත්වය අදාළ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනය වෙත ලබා දීමට ප්‍රමුඛතාවය දිය යුතුය.

(4) සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී සියලු ව්‍යාපෘති අදාළ ව්‍යාපෘති බලධාරීත්වයේ අධීක්ෂණයට ලක් විය යුතුය.

(5) ව්‍යාපෘතිවල තිරසාර බව හා ඵලදායී බව රැකගැනීම සඳහා කටයුතු කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

(6) පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තුවක් සහිත විස්තරාත්මක ව්‍යාපෘති වාර්තාවක් සකස්කර, ව්‍යාපෘති බලධාරියා මගින් අනුමත කරවා ගත යුතුය. රුපියල් මිලියන පහ දක්වා ඉහත පරිදි කටයුතු කළ යුතු අතර, ඊට වැඩි වටිනාකම් ඇති ව්‍යාපෘති සම්බන්ධයෙන් කලින් කළ නිකුත් කරනු ලබන චක්‍රලේඛන උපදෙස්වලට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(7) (i) වර්ෂ කිහිපයක් ගතවන නව ඉදිකිරීම් ව්‍යාපෘති සැලසුම් කරනවිට ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුව දළ වශයෙන් හා එක් එක් වර්ෂයේ නිම කිරීමට අපේක්ෂිත ප්‍රමාණයන් ඉදිරිපත් කළ යුතුය. එසේම ඉදිරි වර්ෂවලදී ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයාගන්නා ආකාරය දැක්විය යුතුය.

(ii) එසේම වසරක් තුළ නිමකිරීමට අපේක්ෂා කරන ව්‍යාපෘතිවල අවශ්‍ය මුළු ප්‍රතිපාදන ප්‍රමාණය සපයාගන්නා ආකාරය පිළිබඳව මනා සැලසුමකින් තොරව ව්‍යාපෘති ආරම්භ කිරීම නොකළ යුතු ය.

(8) දේපළක් පුනරුත්තාපනය කිරීමට හෝ ඉදිකිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේදී රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයකට අයත් විය යුතුය. එසේම ගොඩනැගිලි ඉදිකිරීම හා අළුත්වැඩියා කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමට පෙර එම දේපළ අනාගතයේදී නිරවුල්ව ප්‍රයෝජනයට ගතහැකි බවට සෑහීමකට පත්විය යුතු අතරම, එම ඉදිකිරීම අනාගතයේ දී නඩත්තු කරන ආකාරය පිළිබඳව පැහැදිළි වැඩ පිළිවෙළක් සකස් කළ යුතුය.

(9) අදාළ අංශ සඳහා දක්වා ඇති කාර්යයන්ට අතිරේකව කාලීන අවශ්‍යතා හා විශේෂ අවස්ථා සම්බන්ධයෙන් ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් වීමේ දී, අදාළ පළාත් අමාත්‍යාංශ ලේකම් වෙතින් හෝ ක්‍රියාත්මක බලධාරියා වෙතින් නිර්දේශයක් සහිතව සාධාරණීකරණ වාර්තාවක් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. ඒ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් සෑහීමකට පත්වන අවස්ථාවලදී එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන ලේකම් අනුමැතිය ලබාදිය යුතුය.

(10) පළාත් සේවාවන් සිදුවන රජයේ ලියාපදිංචි පොදු ගොඩනැගිලි සංවර්ධනය හා ඉදිරිකිරීම සඳහා ක්‍රියාත්මක බලධාරීත්වයේ සාධාරණීකරණය මත හා නිර්දේශය මත ප්‍රතිපාදන වෙන් කළ හැකිය.

(11) පළාත් සංවර්ධන වැඩසහටන යටතේ වෙන්කරනු ලබන ප්‍රතිපාදන මගින් නිලධාරීන් පුහුණු කිරීම සිදු නොකළ යුතු අතර ඒවා ප්‍රාග්ධන වියදම් සඳහා යොමුකළ යුතුය.

4. අධ්‍යාපන විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) වෙනත් අරමුදල් ප්‍රභවයන් යොදවා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සමග ද්විකරණය නොවන පරිදි රජයේ පාසල්වල ගොඩනැගිලි ඉදිකිරීම හා සංවර්ධන කටයුතු, ආරක්ෂිත ගේට්ටු ඉදිකිරීම, සනීපාරක්ෂක කටයුතු සහ පානීය ජලය ලබා දීම, ක්‍රීඩා භූමි, ළමා උද්‍යාන ඉදිකිරීම හා සංවර්ධනය ඇතුළු පාසල්වල අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය මත පාසල් සංවර්ධනය සඳහා සෘජුව දායකවන පරිගණක, ඩෙස්, පුටු, තූර්ය වාදන භාණ්ඩ, ක්‍රීඩා උපකරණ හා විද්‍යාගාර උපකරණ වැනි අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ ලබාදීම හා පවතින උපකරණ අලුත්වැඩියාවන් සිදු කළ හැකිය.

(2) පවුලේ ආදායම් මට්ටම අඩු වීම නිසා පොත්පත් සහ අධ්‍යාපන උපකරණ මිලදී ගැනීමට අපොහොසත් සිසුන් සඳහා එක් සිසුවෙකුට වසරකට රුපියල් දස දහසක උපරිමයකට යටත්ව අධ්‍යාපනික උපකරණ වන පොත්පත්, පෑන් පැන්සල්, කවකටු පෙට්ටි හා පොත් බෑග් වැනි දෑ ලබාදිය හැකිය. පවුලේ ආදායම් තත්ත්වය පිළිබඳව ග්‍රාම නිලධාරි හා විදුහල්පතිගේ නිර්දේශය ලබා ගැනීමෙන් අනතුරුව පන්තිභාර ගුරුවරයා මාර්ගයෙන් අදාළ සිසුවාට එම පරිත්‍යාගය සිදු කළ යුතු වේ. එසේම ඒ සම්බන්ධයෙන් පාසලේ අනෙකුත් සිසුන් දැනුවත් නොකළ යුතු අතර, මෙම අරමුදල් භාවිතයට ගෙන සිසුන්ට පොදුවේ පොත් පත් හා උපකරණ ලබාදීම සිදු නොකළ යුතුය.

(3) පළාත් සහා පාසල්වල සිසුන්, ගුරුවරුන් හා විදුහල්පතිවරුන්ගේ දැනුම, කුසලතා, ආකල්ප සංවර්ධනයට හා ඇගයීමට අදාළව සම්මන්ත්‍රණ, පුහුණු වැඩමුළු පැවැත්වීමට කටයුතු කිරීම, එම වැඩමුළු සඳහා තෝරා ගනු ලබන සම්පත්දායකයන් අදාළ විෂය සඳහාවන ප්‍රවීණයන් බවට කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ තහවුරු කළ යුතුය.

(4) විභාග ඉලක්ක කර පවත්වනු ලබන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ පැවැත්වීමේදී වැඩසටහනින් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි නියමිත කාලවකවානු තුළ අදාළ වැඩසටහන සැළසුම් කළ යුතුය.

(5) ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති පහත ආකාරයට විය යුතුය.

(6) පාසල් පද්ධතිය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා සෘජුවම දායකත්වය සපයන්නා වූ අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ වූ කාර්යාලවල භෞතික සම්පත් සැපයීම, සංවර්ධනය සහ අවශ්‍ය අවස්ථාවන්හි දී නිලධාරි පුහුණු වැඩමුළු පැවැත්වීමට කටයුතු කිරීම. මෙහි දි පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශ මත පළාත් අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය සහිතව අදාළ කාර්යයන් ඉටු කළ යුතුය. (පුහුණු වැඩමුළු සඳහා සම්පත් දායකත්වය ලබා ගැනීමේ දී එම සම්පත් දායකයන් අදාළ විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් බවට කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තහවුරු කළ යුතුය).

(i) ළමුන් සඳහා ශිෂ්‍යත්ව උපහාර වැඩසටහන් පැවැත්වීම.

(ii) පාසල් අධ්‍යාපනය අතහැර යන දරුවන්ගේ කුෂලතාවන්ට අනුකූල වෘත්තීමය අධ්‍යාපනයට යොමුකළ හැකි විශේෂ වැඩසටහන් සැලසුම් කිරීමේදී ජාතික ප්‍රතිපත්තීන්ට අනුකූල යෝජනා ඉදිරිපත් කිරීම.

(iii) විශේෂ අධ්‍යාපන හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සඳහා අවශ්‍යවන අත්‍යාවශ්‍ය උපකරණ ලබා දීම.

(iv) රජයේ, පළාත් සභා, පළාත් පාලන ආයතන යටතේ වන පෙර පාසල්වල ගොඩනැගිලි සංවර්ධනය කිරීම කළ හැකිය.

(v) රුපියල් එක් ලක්ෂ පනස් දහසක උපරිමයකට යටත්ව පෙර පාසල් ගුරු පුහුණු වැඩසටහන් පැවැත්වීම.

(vi) පෙර පාසල් ප්‍රඥප්තිය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලියාපදිංචි පෙර පාසල් සඳහා ඩෙස්ක්, පුටු හා අනෙකුත් අත්‍යාවශ්‍ය උපකර රුපියල් පනස් දහසක උපරිමයක් යටතේ ලබා දීම, (මෙම පෙර පාසල් අවම වශයෙන් අවුරුදු 3ක් වත් සක්‍රීයව පවත්වා ගෙන යනු ලබන හා පෙර පාසලේ සිසුන්ට ඉගෙනීමේ කටයුතු සිදු කිරීම සඳහා අත්‍යාවශ්‍ය උපකරණ සපයා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් නොලබන පෙර පාසල් විය යුතුය.

(vii) හඳුනාගත් අවශ්‍යතා සහිත පාසල් සිසුන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් පැවැත්වීම, ද්‍රව්‍ය ආධාර සපයාදීම හා වෙනත් අවශ්‍යතා සඳහා පහසුකම් සැපයීම.

(viii) ජාතික ආහාර සුරක්ෂිතභාවය හා පාසල් මට්ටමින් මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා අවශ්‍ය වන්නා වූ වැඩසටහන් හඳුනා ගැනීම, සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

5. ඉඩම් විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ හැක.

(1) පාරිසරික සංරක්ෂණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් ඉඩම් පුනරුත්ථාපනය හා සංවර්ධනය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

(2) ඉඩම්වලට අදාළ නීතිරීති ක්‍රියාවට නැංවීම, රජයේ ඉඩම් පෞද්ගලික හෝ ආයතනික මට්ටමින් පැවරීම හා ඉඩම් දත්ත පවත්වා ගැනීම වැනි කාර්යයන්ට අදාළ ප්‍රාග්ධන ස්වරූපයේ ආයෝජන සඳහා සැලසුම් කරමින් යෝජනා ඉදිරිපත් කිරීම.

(3) ජනපදලාභීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා පොදු යටිතල පහසුකම් සංවර්ධනය සහ ඉදිකිරීමට යෝජනා ඉදිරිපත් කිරීම.

6. පළාත් පාලන හා පළාත් පරිපාලන විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ හැක.

(1) පළාත් පාලන ආයතන බලප්‍රදේශයන්හි පිහිටි පොදු ග්‍රාමීය මාර්ග සංවර්ධනය හා නඩත්තුව හා අදාළ ග්‍රාමීය මාර්ගවල පිහිටි කුඩා පාලම්, බෝක්කු වැනි අනෙකුත් සංවර්ධන කටයුතු.

(2) ප්‍රජාශාලා, සතිපොළ, පානීය ජල සැපයුම්, පුස්තකාල සේවා, ආදාහනාගාර, සුසාන භූමි නියමානුකූල කිරීම හා සංවර්ධනය, මාතෘ සායන, පෙරපාසල්, ක්‍රීඩාපිටි හා උද්‍යාන වැනි පළාත් පාලන සේවා සංවර්ධනය හා නඩත්තුව.

(3) පළාත් පාලන බල ප්‍රදේශය තුළ සෞඛ්‍යය හා සනීපාරක්ෂාව මනාව පවත්වාගෙන යාම සඳහා ප්‍රජාව දැනුවත් කිරීම, අපද්‍රව්‍ය කළමනාකරණය, පොදු වැසිකිළි, කාණු පද්ධති හා ඇළ මාර්ග, සංවර්ධනය හා නඩත්තුව.

(4) පළාත් පාලන ආයතන පද්ධතිය කාර්යක්ෂමව හා විධිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැපයීම.

(5) රජයේ හා පළාත් පාලන ආයතන ඉඩම්වල පිහිටි ප්‍රජාශාලා, පොදු ගොඩනැගිලි සඳහා ජල පහසුකම් හා විදුලි පහසුකම් ලබා දීම.

(6) පළාත් පාලන ආයතන සේවා වැඩසහටන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට හා දිශාගත කිරීමට නිලධාරීන් හා ප්‍රජාව බලගැන්වීමේ කටයුතු.

(7) පළාත් පාලන සේවා සැපයීමේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සැපයීම හා නඩත්තු ඒකක පවත්වාගෙන යාම.

(8) කසළ කළමනාකරණයට අවශය කසළ වෙන් කිරීමේ බඳුන් හා කොම්පෝස්ට් බඳුන් ලබාදීම.

(9) පළාත් පාලන ආයතනවලට ඉටුකරගත නොහැකි මහා පරිමාණ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම.

(10) ආපදා කළමනාකරණය සඳහා අවශ්‍ය පහසුකම් සහ උපකරණ ලබාදීම.

(11) ප්‍රාදේශීය සභාවේ විධිමත් ලෙස ලියාපදිංචි වසර දෙකකට වඩා සක්‍රීයව පවත්වාගෙන යනු ලබන පුටු හා එකලස් කළ හැකි ආවරණ ප්‍රමාණවත්ව නොමැති ප්‍රජා මණ්ඩල සඳහා රුපියල් ලක්ෂයක උපරිමයකට යටත්ව එම උපකරණ ලබාදීම.

7. කෘෂිකර්ම විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ හැක.

(1) පළාතේ කෘෂි බෝගවල නිෂ්පාදන ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ලියාපදිංචි ගොවි සංවිධානවලට ප්‍රතිලාභී දායකත්වය මුළු වටිනාකමින් 30%ක් වන සේ උපරිමය රුපියල් ලක්ෂ පහක් වන පරිදි කෘෂි උපකරණ ලබාදීම.

(2) පළාතේ කෘෂි බෝගවල නිෂ්පාදන ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ගොවීන් වෙත බීජ, රෝපණ ද්‍රව්‍ය හා යෙදවුම් ප්‍රතිලාභී දායකත්වය මුළු වටිනාකමින් 30%ක් වන සේ රජයේ දායකත්වය උපරිමය රුපියල් ලක්ෂයකට යටත්ව ලබාදීම.

(3) නිෂ්පාදිත කෘෂි භෝග අලෙවි ප්‍රවර්ධනයට අදාළ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම.

(4) වස විසෙන් තොර ගුණාත්මක එළවළු පළතුරු භාවිතය ගෘහස්ථ මට්ටමෙන් සුලභ කිරීම සඳහා කාබනික පොහොර භාවිතය වැඩිකිරීමට අදාළ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම.

(5) අගය එකතුකළ නිෂ්පාදන හා ඒවාට වෙළඳපොළ පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම.

(6) ගොවීන්, ගොවි සංවිධාන සහ ව්‍යාප්ති සේවාවන්ට අදාළ නිලධාරී පුහුණු වැඩ සටහන් පැවැත්වීම.

(7) පාසල්, නිවාස හා රජයේ ආයතන ආශ්‍රිතව ආදර්ශන ලෙස ගෙවතු වගාවන් ප්‍රවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම හා අවශ්‍ය අවස්ථාවල දී යෙදවුම් ලබාදීම.

(8) ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය සහ යෙදවුම් සුලභතාවය ඇති කිරීම තුළින් පළාතේ බෝග නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා කටයුතු සිදු කිරීම.

(9) කෘෂි ව්‍යාපාර හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධනයට හා පසු අස්වනු හානිය අවම කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(10) තරුණ ප්‍රජාව කෘෂිකර්මයට නැඹුරු කරවීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

(11) පරිසර හිතකාමී කෘෂිකාර්මික යෝජනා ඉදිරිපත් කිරීම.

(12) වගාවට නොගත් ඉඩම් ඵලදායී අයුරින් වගා කටයුතු සඳහා යෙදවීමට අදාළ වැඩසහටන් ක්‍රියාත්මක කිරීම.

(13) දේශගුණ විපර්යාසයන්ට ඔරොත්තු දෙන ආකාරයට වැඩිදියුණු කළ බීජ හා රෝපණ ද්‍රව්‍ය ගොවීන් අතර ප්‍රචලිත කිරීම.

(14) පරිසරයට අවම බලපෑම් වන අයුරින් වගාකටයුතු සිදුකළ යුතු ආකාරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.

(15) නව කෘෂිකාර්මික දැනුම ගොවීන් වෙත සම්ප්‍රේෂණය කිරීම.

(16) කෘෂිකර්මාන්තයට අයත් ගොඩනැගිලි ඉදිකිරීම හා සංවර්ධන කටයුතු සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම.

(17) බස්නාහිර පළාත තුළ කෘෂි පර්යේෂණ කටයුතු සහ අත්හදා බැලීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

(18) බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ඇති ගොවිපොළවල් සමෝදානික ගොවිපොළවල් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

(19) බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ඇති ගොවිපොළවල් සඳහා කෘෂි යන්ත්‍රෝපකරණ සපයා දීම සහ අඛණ්ඩ සේවා සැපයුම් පවත්වාගෙන යාම.

8. සුළු වාරිමාර්ග විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) කෘෂිකාර්මික කටයුතු කරනු ලබන ගොවිබිම් සඳහා ජල සැපයුම ලබාදීමේ දී ගොවිබිම් දක්වා ජලය ගෙනයාමට අවශ්‍ය පහසුකම් සැපයීම.

(2) පවතින හා නව වාරිමාර්ග ක්‍රම නඩත්තු කිරීම, සංවර්ධනය කිරීම හා නව වාරිමාර්ග, උපරිම ශ්‍රම දායකත්වය ලබාගත හැකි පරිදි ඉදි කිරීම.

(3) ජල කළමනාකරණය පිළිබඳව ගොවි ජනතාව දැනුවත් කිරීමට වැඩසටහන් පැවැත්වීම.

(4) සුළු වාරිමාර්ගවලට අයත් ඉදිකිරීම් හෝ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත වාරිමාර්ග හෝ වෙනත් අංග සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම.

(5) කෘෂිකාර්මික බිම් සඳහා ප්‍රවේශවීමට කෘෂිමාර්ග හා ට්‍රැක්ටර් පැන්නුම් ඉදිකිරීම.

(6) වාරිමාර්ග ඉදිකිරීම් හා නඩත්තුවට අදාළ යාන්ත්‍රික උපකරණ මිලදී ගැනීම හා අඛණ්ඩ සේවා සැපයුම් පවත්වා ගෙන යාම.

9. කර්මාන්ත විෂය යටතේ යෝජනා හඳුනා ගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) විවිධ පරාසයන් ආවරණය වන පරිදි දේශීය සම්ප්‍රදායික කර්මාන්ත දිරිගැන්වීම හා එම නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට හැකිවන පරිදි ලියාපදිංචි කරන ලද ක්‍රියාකාරී කුඩා කර්මාන්ත සමිතියක, නිශ්චිතව හඳුනාගත් ව්‍යාපෘති සඳහා,

අවශ්‍ය යෙදවුම් හා තාක්ෂණික උපකරණ මිලදී ගැනීම සඳහා අධාර ලබාදිය හැකිය. එහිදී වටිනාකමින් 30%ක දායකත්වයක් අදාළ සමිතිය මගින් දැරිය යුතු අතර, ලබා දිය හැකි උපරිම ආධාර වටිනාකම රුපියල් ලක්ෂ තුනකි. මේ සඳහා ව්‍යාපෘති වාර්තාව සමග අදාළ කර්මාන්ත විෂය පිළිබඳ තාක්ෂණික දැනුම සහිත නිලධාරියෙකුගේ නිර්දේශය අනිවාර්ය වේ. මීට අමතරව දේශීය සම්ප්‍රදායික කර්මාන්තයෙහි යෙදෙන එක් ප්‍රතිලාභියෙකු සඳහා උපකරණ ලබා දෙන්නේනම් 30%ක ප්‍රතිලාභී දායකත්වය මත රුපියල් ලක්ෂයක උපරිමයකට යටත්ව ලබාදිය යුතුය.

(2) කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවියට වෙළඳපොළ හඳුන්වා දීමත්, වෙළෙඳ මධ්‍යස්ථාන පිහිටුවීම හා එම මධ්‍යස්ථාන සංවර්ධනය, ජංගම වෙළඳපොළවල් සහ ප්‍රදර්ශන පැවැත්වීම සඳහාත් දායකවීම.

(3) නව තාක්ෂණික ක්‍රමවේද හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සළසාදීම.

(4) කර්මාන්තවල නියැලෙන අයගේ හැකියාවන් ප්‍රවර්ධනයට පුහුනු වැඩසටහන් පැවැත්වීමේ දී ඉලක්කගත කණ්ඩායම අනුව වඩාත්ම සුදුසු සම්පත් දායකයන් තෝරාගත යුතුය. ඒ සඳහා ව්‍යාපෘතියේ ස්වභාවය අනුව ව්‍යාපාති හෝ ක්‍රියාත්මක බලධාරියාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. සම්පත්දායකයා විෂය ක්ෂේත්‍රයට අදාළ වෘත්තීය නිපුණත්වයෙන් යුතු පිළිගත් ආයතනයකින් ලබා ගත් සහතික සහිත ප්‍රවීණයෙකු විය යුතුය. සම්පත්දායකයා, එවැනි පිළිගත් සහතික ඉදිරිපත් කළ නොහැකි නිපුණතා සහිත ශිල්පියකු වන අවස්ථාවක දී, ඒ සඳහා අදාළ විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

(5) ස්වයං රැකියාවක නිරත හෝ නිරතවීමට අපේක්ෂිත පුද්ගලයින්ගේ පුහුණු පාඨමාලාවන් සඳහා එක් පුද්ගලයෙකුට රුපියල් පනස් දහසක උපරිමයකට යටත්ව ප්‍රතිපාදන ලබා දිය හැකි අතර, වෙනත් ක්‍රමයකින් ආවරණය නොවූ හා මීට පෙර එවැනි අනුග්‍රාහක දීමනාවක් ලබා නොමැති අය හා පහත පුද්ගල කාණ්ඩවලට ඇතුළත් අඩු ආදායම්ලාභීන්ට ප්‍රමුඛත්වයක් ලබා දිය යුතුය.

(i) අඩු ආදායම්ලාභී පවුල්වල අවු. 18-45 ත් අතර සිටින පුද්ගලයින්
(ii) මාතෘ මූලික
(iii) විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්

(6) අඩු ආදායම්ලාභීන් සඳහා පළාත් සංවර්ධන මූල්‍ය මූලාශ්‍රය යටතේ ස්වයං රැකියා උපකරණ ලෙස සෘජු ප්‍රදාන ලබා දීමේ දී, 20% ක අවම ප්‍රතිලාභි දායකත්වය මත රජයේ දායකත්වය ලෙස රුපියල් ලක්ෂයක උපරිමයකට යටත්ව ස්වයං රැකියා උපකරණ ලබා දීම.

මෙම වගන්තිය යටතේ කුමක් සඳහන් වුවද, විශේෂිත තත්ත්වයන් යටතේ 20%ක් වශයෙන් වන අවම ප්‍රතිලාභී දායකත්වය කවර ප්‍රතිශතයක් විය යුතු ද යන්න පිළිබඳ අදාළ විෂයය භාර අමාත්‍යාංශ ලේකම් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු සැලකිල්ලට ගෙන ප්‍රධාන ලේකම් විසින් තීරණය කළ හැකිය.

එසේම, එම සෘජු ප්‍රදාන ලබන ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනය අනුමැතියට ඉදිරිපත් කළ යුතු අතර, බස්නාහිර පළාතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් දිරිගැන්වීම සඳහා කටයුතු කිරීම, ඔවුන්ට ව්‍යවසායකත්ව පුහුණුව හා ශිල්පීය පුහුණුව ලබා දීම, මූල්‍ය සේවාවන් හා මූල්‍ය ණය පහසුකම් ලබා දීම, ඔවුන් සඳහා විශ්‍රාම වැටුපක් සකස් කිරීම හා අලෙවිකරුවන්ගේ තොරතුරු ජාලගත කිරීමේ වැඩසටහන් හා පළාතේ නව නිපැයුම්කරුවන් ඒකාරාශී කර ඔවුනට වැඩසටහන් පවත්වා ඔවුන් මධ්‍යම රජයේ ආයතන හා සම්බන්ධ කර ජාතික සංවර්ධනයට දායක කිරීම කෙරෙහි අවධානය යොමුකළ යුතු අතර, ඒ යටතේ ව්‍යාපෘතියට අදාළ ප්‍රාග්ධන භාණ්ඩ පමණක් ලබා දිය යුතුවේ. පාරිභෝගික භාණ්ඩ ලබා නොදිය යුතුය.

10. පාරිසරික කටයුතු විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) බස්නාහිර පළාතේ දැනට පවතින පරිසර පද්ධතිය තිරසාරව පවත්වාගෙන යාම.

(2) පළාත්වාසී ප්‍රජාව සඳහා නාගරික තුරුගොමු, වන උයන්, ඔසු උයන් ඇතුළු පාරිසරික උද්‍යාන ඇති කිරීම.

(3) මාර්ග දෙපස හරිත තීරු ඇති කිරීම.

(4) රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතන සම්බන්ධ කරගෙන පරිසර සංවර්ධනය සඳහා හවුල් ක්‍රියාකාරීත්වයක් ඇති කිරීම, හරිත ගම්මාන සහ ඔසු ගම්මාන ඇති කිරීම.

(5) ජල මූලාශ්‍ර, ඇළ හා දොළ මාර්ග, වැව් හා පොකුණු, වෙරළ තීර හා කලපු යනා දී ජලජ පරිසර පද්ධති ආරක්ෂා කිරීම හා වැඩි දියුණු කිරීම.

(6) බස්නාහිර පළාතේ ප්‍රබල පාරිසරික ගැටලු හඳුනාගෙන විසඳීම සඳහා පාර්ශවකාර ආයතන/පුද්ගලයන් සමග සම්බන්ධීකරණයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(7) පාරිසරික දිනය සැමරීම.

(8) ජාතික මට්ටමේ පරිසර වැඩසටහන් හා සම්බන්ධිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(9) වඳවී යාමට හා තර්ජනයට ලක් වූ ශාක හා සත්ත්ව විශේෂ සංරක්ෂණය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

11. සංස්කෘතික හා කලා කටයුතු විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ හැක.

(1) පළාත තුළ පවත්නා සංස්කෘතික දායාදයන් හා උරුමයන් සුරකමින් අනාගත පරපුරට දායාද කිරීමට උපකාරී වන ව්‍යාපෘති යෝජනා හඳුන්වාදීම.

(2) අඩු පහසුකම් පවතින ලියාපදිංචි ආගමික සිද්ධස්ථානවල හා දහම්පාසල්වල අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා රුපියල් ලක්ෂ පහක උපරිමයකට යටත්ව ප්‍රතිපාදන ලබාදිය හැකිය. එහිදී මීට පෙර ප්‍රතිපාදන නොලැබුණු ආගමික සිද්ධස්ථාන හා දහම් පාසල් සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතුය.

(3) අඩු පහසුකම් පවතින ලියාපදිංචි දහම් පාසල් සඳහා දහම් පාසල් කටයුතු පවත්වාගෙන යෑම සඳහා අත්‍යාවශ්‍ය උපකරණ ලබා දිය හැකි අතර, අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ සංස්කෘතික නිලධාරින්ගේ නිර්දේශය මත එක් දහම් පාසලක් සඳහා වසර තුනකට වරක් වෙන් කළ හැකි උපරිමය රුපියල් ලක්ෂ දෙකකි.

(4) පාරම්පරික නැටුම් හා වෙනත් කලා කටයුතු සංරක්ෂණය හා ප්‍රවර්ධනය වන උත්සවයකට හෝ එක් පාරම්පරික නැටුම් කණ්ඩායමකට අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීමට උපරිම රුපියල් ලක්ෂ දෙකක ප්‍රතිපාදන වෙන් කළ හැකිය. උපරිම ප්‍රතිපාදන සීමාව ඉක්මවා ප්‍රතිපාදන සැළසිය යුතු අවස්ථාවලදී පළාත් සැලසුම් කමිටුව මගින් අනුමැතිය ලබා ගෙන අදාළ ප්‍රතිපාදන වෙන් කිරීම.

(5) රජයේ ලියාපදිංචි කලායතන සඳහා අදාළ සංගීත භාණ්ඩ ලබා දීමට ප්‍රතිලාභී දායකත්වය 20%ක් යටතේ උපරිමය රුපියල් ලක්ෂයක් දක්වා පළාත් සංස්කෘතික නිලධාරීගේ නිර්දේශය මත ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කිරීම.

(6) පළාත් සභාව සතු සංස්කෘතික මධ්‍යස්ථාන සංවර්ධනයට හා ඒවායේ කටයුතු ප්‍රවර්ධනය සඳහා උපකාරී වන ව්‍යාපාති යෝජනා ක්‍රියාත්මක කිරීම.

(7) විවිධ සංස්කෘතික හා කලා ක්ෂේත්‍රයන්හි සුවිශේෂී හැකියාවන් දැක්වූ පුද්ගලයින් ඇගයීම සඳහා හා ප්‍රාදේශීය මට්ටමින් උපරිමය රුපියල් ලක්ෂ හතරක් වෙන් කිරීමටත්, උපරිම සීමාව ඉක්මවන පළාත් හෝ දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා විෂයය භාර අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ මත ප්‍රධාන ලේකම් සෑහීමකට පත්වන අවස්ථාවලදී එම යෝජනා ප්‍රධාන ලේකම් අනුමත කළ යුතුය.

(8) ප්‍රජාවගේ රසවින්දනය හා කලා හැකියාවන් වර්ධනය සඳහා ප්‍රාදේශීය වශයෙන් උපරිම රුපියල් ලක්ෂ දෙකක ප්‍රතිපාදන වෙන් කරමින් වැඩසටහන් සැලසුම් කිරීම, එසේ වුව ද, විෂයභාර අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශමත ප්‍රධාන ලේකම් සෑහීමකට පත්වන අවස්ථාවන්හිදී උපරිම ප්‍රතිපාදන සීමාව ඉක්මවා රුපියල් ලක්ෂ පහක් දක්වා ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත ප්‍රතිපාදන වෙන් කළ හැකිය.

(9) පාරම්පරික නැටුම් හා වෙනත් කලා කටයුතු සංරක්ෂණය හා ප්‍රවර්ධනය සහ ආගමික, සංස්කෘතික, කලා කටයුතු යටතේ ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද පෙරහැරවල් හෝ ඓතිහාසික වශයෙන් කාලාන්තරයක් තිස්සේ පවත්වාගෙන ආ පෙරහැරවල් පැවැත්වීම සඳහා අනුග්‍රාහක මුදලක් ලබා දිය හැකිය. මේවා තෝරා ගැනීමේදී පළාත් සංස්කෘතික නිලධාරීන්ගේ නිර්දේශය ලබා ගත යුතු අතර, මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් සංස්කෘතික අමාත්‍යාංශය යටතේ හෝ සුදුසු බලධාරීත්වයක් යටතේ ක්‍රියාත්මක කළ යුතුය.

(10) ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් සංවිධානය කරන, කොට්ඨාස මට්ටමින් හා දිස්ත්‍රික්ක මට්ටමින් පැවැත්වෙන වාර්ෂික සාහිත්‍ය උත්සව හා ඒ සඳහා වන අනුශාංගික කරුණු වෙනුවෙන් උපරිමය රුපියල් ලක්ෂයක් දක්වා ප්‍රතිපාදන වෙන්කළ හැකිය.

(11) බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය ඇති වෘද්ධිගත හෝ පූර්ණ, අර්ධ අකර්මන්‍යතාවයට හෝ වෙනත් එවැනි විපතකට පත් වූ සුවිශේෂ මෙහෙවරක් ඉටු කරන ලද කලාකරුවන් ඇගයීම උදෙසා එක් වරක් පමණක් රුපියල් ලක්ෂයක උපරිමයකට යටත්ව මූල්‍යාධාරයක් ලබාදීම.

12. සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) රෝහල්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල, මධ්‍යම බෙහෙත් ශාලා, ඖෂධ ගබඩා, නිල නිවාස, සායනික ගොඩනැගිලි, අභ්‍යන්තර පිවිසුම් මාර්ග, අපවහන පද්ධති හා වෙනත් සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ යටිතල පහසුකම් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(2) රජයේ සෞඛ්‍ය ආයතනවල මහජන සෞඛ්‍ය සේවාවන් මනා ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය වන උපකරණ හා යන්ත්‍ර සූත්‍ර ලබාදීම.

(3) රෝග නිවාරණ හා ප්‍රතිකාර සේවා ශක්තිමත් කිරීමට සහ ගුණාත්මකභාව වැඩි කිරීමට අවශ්‍ය පුහුණු වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩසටහන් හා ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අඩු ආදායම්ලාභී පවුල්වල ගර්භනී කාන්තාවන්, අවුරුදු 5ට අඩු ළමුන් සහ පාසල් ළමුන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම හා සනීපාරක්ෂාව ඉහළ නැංවීම සඳහා වැඩසටහන් පැවැත්වීම.

(4) රෝග නිවාරණ හා ප්‍රතිකාර සේවා ශක්තිමත් කිරීමට අවශ්‍ය තාක්ෂණය හඳුන්වාදීම.

(5) පාරම්පරික වෛද්‍ය ක්‍රම සංරක්ෂණය හා සංවර්ධනය කිරීම.

(6) ඔසු උයන් සහ ඖෂධ නිෂ්පාදනය වැඩිදියුණු කිරීමට ක්‍රියාමාර්ග ගැනීම.

(7) අඩු ආදායම්ලාභී පවුල් සඳහා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා එක් ප්‍රතිලාභී පවුලකට උපරිමය රුපියල් ලක්ෂයක් වන පරිදි හා ප්‍රතිලාභී දායකත්වය ඉන් 25%ක් වන පරිදි ද්‍රව්‍යාධාර හෝ මූල්‍යාධාර ලබාදීම.

13. පරිවාස හා ළමාරක්ෂක සේවා විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) පරිවාස භාරයේ සිටින ළමුන්ගේ දෛනික අවශ්‍යතා හා සුබසාධනය තහවුරු කිරීම.

(2) පරිවාස ළමුන් සමාජගත කිරීමේදී ළමුන්ට අවශ්‍ය දැනුම හා හැකියා වර්ධනයට අවශය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(3) ළමුන් පරිවාසගත වීම වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

(4) පරිවාස දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි සහ ලියාපදිංචි ළමා නිවාස ඉදිකිරීම් හෝ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම.

(5) අනාථ, අත්හල, අසරණ හා අපයෝජනයට ලක් වූ දරුවන්ගේ ආරක්ෂාව හා රැකවරණය සැලසීමට දැනුවත් විය යුතු කාර්යමණ්ඩල වල ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(6) ළමුන් නිවාස ගතවීම වළක්වා පවුල තුළම රැකවරණය සැලසීමේ අරමුණින් අඩු ආදායම්ලාභී පවුල්වල ළමුන්ගේ දෙමාපියන්, භාරකරුවන් සඳහා 20% අවම ප්‍රතිලාභී දායකත්වය මත ස්වයං රැකියා උපකරණ ලබාදීම සඳහා රජයේ දායකත්වය උපරිම රුපියල් ලක්ෂයක් දක්වා ප්‍රාග්ධන ප්‍රතිපාදන සැලසීම.

14. විදුලිබල හා බලශක්ති විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) විදුලි රැහැන් පද්ධතිය දීර්ඝ කිරීම හා නවීකරණය, එකලා විදුලිය තෙකලා කිරීම, විදුලි උප පොලවල් ස්ථාපිත කිරීම හා විදුලි කණු විතැන් කිරීම.

(2) අඩු ආදායම්ලාභී, පාසල් අධ්‍යාපනය ලබන දරුවන් සිටින, විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සිටින නිවාස සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය මත ජාතික විදුලිබල පද්ධතියේ විදුලි සම්බන්ධතාව ලබා දීමට උපරිමය රුපියල් තිස්පන් දහසක් ලබා දීම. මෙම ගෙවීම් විදුලි සම්බන්ධතාවය සපයන ආයතන වෙත පමණක් ගෙවිය යුතුය.

(3) අවශ්‍ය අවස්ථාවලදී විකල්ප බලශක්ති ප්‍රභවයන් හඳුන්වා දීම, සංවර්ධනය කිරීම හා ජාතික විදුලිබල පද්ධතිය හා සම්බන්ධ කිරීම.

(4) පළාත් පාලන ආයතන සතු හෝ පළාත් පාලන ආයතනවලට බුක්තිය පවරා ඇති පොදු සේවා පහසුකම් සපයන ආයතන සහ රජයේ ඉඩම්වල පිහිටි ප්‍රජාශාලා සඳහා විදුලිය ලබාදීම.

15. පළාත් මාර්ග විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකල යුතුය.

(1) සී හා ඩී වර්ගයට අයත් මාර්ග අලුතින් ඉදිකිරීම පවත්නා මාර්ග වැඩිදියුණු කිරීම හා මාර්ග නිසි ලෙස නඩත්තු කිරීම.

(2) මාර්ග සංවර්ධනයේදී එහි තිරසර බව ආරක්ෂා කිරීමට මාර්ගය දෙපස කාණු පද්ධතිය සැකසීම බෝක්කු හා කුඩා පාලම් ප්‍රතිසංස්කරණය.

(3) පළාත් මාර්ග, කුඩා පාලම්, බෝක්කු හා කාණු පද්ධති ඉදිකිරීම හා සංවර්ධනය.

(4) අදාළ ආයතනයන්හි නිර්දේශ මත අවශ්‍යතාවයට සරිලන පරිදි විධිමත් මාර්ග සංඥා සවිකිරීම.

16. නිවාස හා ඉදිකිරීම විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවසක ඉතිරි වැඩ හෝ අළුත්වැඩියා කටයුතු සඳහා ඉඩමේ හිමිකම තහවුරු කර ගැනීමෙන් පසු එක් ප්‍රතිලාභී පවුලකට උපරිමය රුපියල් ලක්ෂයක් සහ අවමය රුපියල් තිස් දහසකට යටත්ව අනුග්‍රාහක මුදලක් හෝ ද්‍රව්‍යමය ආධාර ලබාදිය හැකිය.

සුවිශේසි ආපදා අවස්ථාවකදී (නායයාම්, ගිනිගැනීම්, සුළිසුළං, ජල ගැලීම් වැනි) උපරිමය රුපියල් ලක්ෂ පහක මුදලක් ප්‍රාදේශීය ලේකම්ගේ විශේෂ නිර්දේශය යටතේ ප්‍රධාන ලේකම්ගේ අනුමැතියට යටත්ව ලබාගත හැකිය.

ඉහත හිමිකම් සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දී පහත සඳහන් එක් කරුණක් හෝ සපුරාලන පවුල් සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුය. මෙම කරුණු ග්‍රාම නිලධාරීගේ සහතිකය මගින් තහවුරු කරගත යුතුය.

(i) පාසල් දරුවන්, ආබාධිත අය සිටින අඩු ආදායම්ලාභීන්වීම.
(ii) පවුලේ ආදායම උපයන්නා මිය යාම නිසා අසරණභාවයට පත්වීම.
(iii) ගෘහ මූලිකයා කාන්තාවක් වන අඩු ආදායම්ලාභී පවුලක්වීම.

17. සමාජ සුභසාධනය විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) රෝගී බව, මහළු බව, ආබාධිත බව හෝ අනාථභාවය නිසා සමාජීය වරප්‍රසාද අහිමි වූ පුද්ගලයන් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සුබසාධනය හා අධ්‍යාත්මික සංවර්ධනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

(2) සමාජ සුබසාධනයට වැදගත් වන විධිමත් ලෙස රජයේ ලියාපදිංචි වූ සුබසාධන හා මරණාධාර සංවිධාන, වැඩිහිටි සමිති හා වැඩිහිටි බල මණ්ඩල සඳහා උපරිම රුපියල් ලක්ෂයක් වන පරිදි අත්‍යාවශ්‍ය උපකරණ පමණක් ලබාදිය හැකිය.

(i) එම උපකරණ පොදු සුබසාධන කටයුතු සඳහා භාවිතා කළ යුතු අතර, අදාළ ආයතනයේ භාණ්ඩ වට්ටෝරු ලේඛනයට ඒවා ඇතුළත් කළ යුතුය.

(ii) ඉහත භාණ්ඩ ලබා දීමේදී අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය මත, විධිමත් පරිදි භාණ්ඩ භාරදී ලේඛනගත කළ යුතුය.

(3) වැඩිහිටි නිවාස හා ආබාධිත පුද්ගලයින් පුනරුත්ථාපනය කෙරෙන නිවාසවලට අවශ්‍ය උපකරණ ලබාදීම.

(4) වැඩිහිටියන් හා අවාසි සහගත ප්‍රජාව නිවාසගතවීම වැළැක්වීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා එවැනි වැඩිහිටි හා අවාසි සහගත ප්‍රජාව මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් සාමාන්‍ය ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. වැඩිහිටි නිවාසවල සිටින නේවාසික වැඩිහිටියන් උදෙසා අධ්‍යාත්මක සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.

(5) ශ්‍රම බලකායට අයත්වන අවාසි සහගත ප්‍රජාව නිවාස ගතවීම වැළැක්වීම සඳහා ස්වයං රැකියා උපකරණ හා පුහුණු වැඩසටහන් සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්කළ හැකිය. පළාත් සමාජ සේවා අධ්‍යක්ෂක හෝ ඔහු/ඇය විසින් නම් කරනු ලබන ප්‍රාදේශීය නිලධාරියකුගේ නිර්දේශය සහිතව එම ප්‍රතිපාදන සැළසිය හැකිය.

(6) බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ අවාසි සහගත ප්‍රජාවගේ රැකවරණය හා සුරක්ෂිතභාවය සැලසීම හා ඒ සම්බන්ධව දැනුවත් විය යුතු කාර්යමණ්ඩලවල ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(7) අඩු ආදායම්ලාභි ආබාධිත පුද්ගලයින්, මාතෘ මූලික පවුල් හා රෝගී පුද්ගලයන් (පිළිකා, වකුගඩු රෝග වැනි) ජීවත්වන නිවාසවල ඔවුන්ට අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අදාළ කොට්ඨාසයේ පළාත් සමාජ සේවා නිලධාරී හා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය මත උපරිමය රුපියල් ලක්ෂ දෙකක් දක්වා ප්‍රතිපාදන වෙන් කළ හැකිය.

(8) අඩු ආදායම්ලාභී පවුල්වල විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් විශේෂයෙන් පාසල් යන වයසේ දරුවන්ට රුපියල් ලක්ෂයක උපරිමයකට යටත්ව ඔවුන්ගේ දෛනික ජීවිතය පහසු කරවන විශේෂිත උපකාරක උපකරණ ලබා දීම සහ උසස් අධ්‍යාපන කටයුතුවල නිරතවන විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා විශේෂිත අධ්‍යාපන උපකරණ ලබා දීම, මෙම උපකරණ ඔවුන්ගේ විශේෂ අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විය යුතුය. මෙවැනි උපකරණ ලබාදීමේදී ඒ සඳහා වෛද්‍ය නිර්දේශය සහ පළාත් සමාජ සේවා අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගත යුතුය.

(9) විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්, වැඩිහිටියන් නේවාසිකව වෙසෙන ආයතනවල නේවාසිකයින් සඳහා බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ස්වයං රැකියා පුහුණු පාඨමාලා පැවැත්වීමට රුපියල් පනස් දහසක අපරිමයකට යටත්ව ප්‍රතිපාදන ලබා දීම. (අමුද්‍රව්‍ය, සම්පත්දායක දීමනා ආදිය.)

18. වතු යටිතල පහසුකම් විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේ දී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) වතුවල ජීවත් වන ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා වතු මාර්ග වැඩි දියුණු කිරීම, ජල හා විදුලි පහසුකම් ලබාදීම යටතේ පාසල් අධ්‍යාපනය ලබන දරුවන් සිටින අඩු ආදායම්ලාභී පවුල් වලට අයත් නිවාස සඳහා විදුලි සම්බන්ධතාවය ලබාගැනීමට එක් ප්‍රතිලාභී පවුලකට රුපියල් තිස්පන්දහසක උපරිමයකට යටත්ව අනුග්‍රාහක මුදලක් ලබාදිය හැකිය. ආදායම් තත්ත්වය පිළිබඳ ග්‍රාම නිලධාරීගේ සහතියක් ලබාගත යුතුය. නිවසකට විදුලිය ලබාගැනීම උදෙසා ලබාදෙන මෙම මුදල ගෙවිය යුත්තේ විදුලි සම්බන්ධතාවය සපයනු ලබන ආයතනයටයි.

(2) වතුවල ජීවත්වන ජනතාවගේ නිවාස සංවර්ධනය සඳහා ප්‍රතිලාභ ලබා දීමේ දී, ඍජු ප්‍රදාන ලබාදීමට ප්‍රතිපාදන වෙන් කළ නොහැකිය.

(3) නිසි ක්‍රමවේදයක් මගින් වතු මාර්ග නිශ්චිතව හඳුනා ගැනීම සිදු කළ යුතුය. මෙහිදී වතු ජනාවාසවලට ප්‍රවේශ වීම සඳහා තිබෙන මාර්ග පමණක් සංවර්ධනය කළ යුතුය.

19. ප්‍රවාහන විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙන් නඩත්තු වන බස් නැවතුම්පල අංගන හැර අනෙකුත් ප්‍රධාන බස් අංගන ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය.

(2) පාර දෙපස මගී ආවරණ ඉදිකිරීම තුළින් පොදු ජනතාවට ගුණාත්මක සේවාවක් ලබාදීම.

(3) පළාත තුළ මගී ප්‍රවාහන බස් රථ, ත්‍රී රෝද රථ, පාසල් ළමුන් ප්‍රවාහන සේවා බස් රථ හා කාර්යය මණ්ඩල ප්‍රවාහන සේවා රථ තුළින් සිදුවන රිය අනතුරු අවම කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(4) වඩා සුහදශීලී සේවාවක් ප්‍රජාවට ලබා දීම සඳහා රියදුරන් හා කොන්දොස්තරවරුන් පුහුණු කිරීම හා ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

20. ක්‍රීඩා විෂය යටතේ ව්‍යාපෘති යෝජනා හඳුනා ගැනීමේ දී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය. එසේම පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ව්‍යාපෘති යෝජනා හඳුනා ගැනීම සිදු කළ යුතුය.

(1) පළාත් පාසල් නොවන රජයට අයත් ක්‍රීඩා පිටි, ක්‍රීඩා මධ්‍යස්ථාන හා ඒ හා සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

(2) බස්නාහිර පළාතේ ක්‍රීඩාවට සම්බන්ධ පාර්ශ්ශවකරුවන්ගේ කුසලතා වර්ධනය සඳහා

(i) ක්‍රීඩා අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම

(ii) ක්‍රීඩා පුහුණු සංචිත ඇති කිරීම හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
(iii) පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කෙට්ඨාස හා ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් විවිධ ඉසව් අනුව ක්‍රීඩා තරග පැවැත්වීම.

(3) ක්‍රීඩා ක්ෂේත්‍රයේ සුවිශේෂී හැකියාවන් දැක්වූ ක්‍රීඩක, ක්‍රීඩිකාවන්, ඒ සඳහා දායක වූ ක්‍රීඩා නිලධාරීන් හා පුහුණුකරුවන් ඇගයීම සඳහා ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් ඇගයීම් වැඩසටහන් පැවැත්වීම.

(4) පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂගේ සහ විෂය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරණු ලැබූ ක්‍රීඩා නිලධාරියකුගේ නිර්දේශ මත.

(i) ලියාපදිංචි ක්‍රීඩා සමාජ හා පෞද්ගලික නොවන ව්‍යායාම මධ්‍යස්ථාන ප්‍රවර්ධනය සඳහා වාර්ෂිකව රුපියල් එක් ලක්ෂ පනස් දහසක උපරිමයකට යටත්ව ක්‍රීඩා උපකරණ ලබාදීම.

(ii) පළාත් මට්ටමින් හෝ ජාතික මට්ටමින් ක්‍රීඩා තරග නියෝජනය කරන හෝ සුවිශේෂී හැකියා සහිත පළාත් හෝ ජාතික මට්ටමේ දක්ෂතා සඳහා විභවයක් සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් දිරි ගැන්වීම සඳහා ක්‍රීඩා උපකරණ, ක්‍රීඩා ඇඟළුම් හා ක්‍රීඩාවට අවශ්‍ය අනෙකුත් ද්‍රව්‍ය එක් අයෙකුට වසරකට උපරිමය රුපියල් හැත්තෑපන් දහසකට යටත්ව ලබාදීම.

(iii) ජාතික මට්ටමේ ක්‍රීඩා තරග නියෝජනය කරන පළාතේ අඩු ආදායම්ලාභී ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ අවශ්‍යතාවයන් සැපිරීම සඳහා අවම වශයෙන් වසරක කාල පර්ච්ඡේදයක් සඳහා මාසිකව රුපියල් දස දහසක උපරිමයකට යටත්ව පුද්ගලික අංශයේ දායකත්වයද සහිතව පෝෂණ ආධාර ලබාදීම.

(iv) ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ජාත්‍යන්තර මට්ටමේ තරග ජයග්‍රහණ ලබා ගන්නා පළාත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් දිරි ගැන්වීම සඳහා උපරිමය රුපියල් ලක්ෂයකට යටත්ව මූල්‍යාධාර ලබාදීම.

(5) පළාත් ජනතාවගේ ශාරීරික හා මානසික සෞඛ්‍ය ඉහළ නැංවීමට අවශ්‍ය වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(6) ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් ක්‍රීඩා ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් නිසි පරිදි සංවිධාන ගත කිරීම හා ඊට අදාළ වැඩසටහන් පැවැත්වීම.

21. යෞවන කටයුතු විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) තරුණ ප්‍රජාවගේ වෘත්තීය හැකියාවන් වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

(2) තරුණ ප්‍රජාව නවීන තාක්ෂණයට හුරු කරවීම සඳහා වැඩසටහන් පැවැත්වීම.

(3) තරුණ ප්‍රජාව තුළ නායකත්ව, ආකල්ප හා පෞරුෂ සංවර්ධනය අරමුණු කරගනිමින් වැඩසටහන් පැවැත්වීම.

(4) වැඩසටහන් අනුමත කිරීමේදී වර්ෂයේ මුල් කාර්තු දෙක තුළ සිදුකිරීම.

(5) මත් ද්‍රව්‍ය නිවාරණය අරමුණු කර ගනිමින් තරුණ ප්‍රජාව උදෙසා වැඩසටහන් පැවැත්වීම.

(6) දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළ ඉලක්ක කර ගත් වෘත්තීය පුහුණු සඳහා දායකත්වය ලබාදීම.

22. කාන්තා කටයුතු විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) ස්වයං රැකියාවක නිරත හෝ ස්වයං රැකියාවක් ආරම්භ කිරීමට අපේක්ෂිත අඩු ආදායම්ලාභී කාන්තාවන් සඳහා 20%ක අවම ප්‍රතිලාභී දායකත්වය මත රජයේ දායකත්වය රුපියල් ලක්ෂයක උපරිමයකට යටත්ව ප්‍රාග්ධන ප්‍රතිපාදන ලබාදීම.

(2) පීඩාවන්ට පත්වූ කාන්තාවන් හඳුනා ගැනීම හා ඔවුන්ගේ ජීවන මට්ටම ඉහල නැංවීම සඳහා ව්‍යාපෘති යෝජනා කිරීම.

(3) ආර්ථික, සාමාජීය හා දේශපාලනික පරිසරයන් තුළ ප්‍රමුඛතාවය ලබා ගැනීම සඳහා පෞරුෂ සංවර්ධන, නායකත්ව වැඩමුළු පැවැත්වීම.

(4) කාන්තා උපදේශන වැඩසටහන් පැවැත්වීම.

23. සමුපකාර සංවර්ධන විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) පාරිභෝගික ආකර්ෂණයට ලක්වන අයුරින් ව්‍යාපාරික ස්ථාන සංවර්ධන හා ගුණාත්මක භාණ්ඩ ඇලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(2) සමුපකාර ක්ෂේත්‍රය තුළ නිරත නිලධාරීන්ගේ කුසලතාවන් ප්‍රවර්ධනයට සම්ප්‍රදායික පුහුණු හා වැඩසටහන් වලින් ඉවත් වී තරගකාරීත්වයට ගැලපෙන පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම.

(3) සමුපකාර මූල්‍ය අංශවල මුදල් ග්‍රාමීය අංශවල ආයෝජනය කිරීමට සුදුසු ව්‍යාපෘති ඉදිරිපත් කිරීම.

(4) සමුපකාර විෂය දැනුම පාසල් ළමුන්ට ලබා දීම සඳහා පාසල් සමුපකාර සමිති ලියාපදිංචි කිරීමට වැඩසටහන් යෝජනා කිරීම.

24. ජල සම්පාදන හා ජලාපවාහන විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) පානීය ජල පහසුකම් ලබා දීම සඳහා ප්‍රජාවට සුදුසු ජල පහසුකම් ලබාදීම.

(2) ප්‍රජා ජල ව්‍යාපෘති යටතේ ජල පහසුකම් සැපයීම.

(3) පානීය මෙන්ම අනෙකුත් අවශ්‍යතා සඳහා භාවිතාවන පොදු ළිං ඉදි කිරීම හා සංවර්ධනය කිරීම.

(4) අවශ්‍යතාවය අනුව සුදුසු ස්ථාන වෙත ජල පහසුකම් ලබා දීම.

(5) ජල මූලාශ්‍රයන්ගේ ශක්‍යතාවය හඳුනාගැනීම හා ජලයේ ගුණාත්මක භාවය පරීක්ෂා කිරීම.

25. ධීවර විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) ග්‍රාමීය ජනතාවගේ පෝෂණ ඌණතාවයන් අවම කිරීම හා ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා මත්ස්‍ය නිෂ්පාදනය සුලභ කිරීමට, මිරිදිය හා සුළු පරිමාන කරදිය ධීවර කර්මාන්තයේ නියුතුවන්නන්ට ධීවර ආම්පන්න හා උපකරණ වසර තුනකට වරක් ප්‍රතිලාභි දයකත්වය 30%ක් යටතේ උපරිමය රුපියල් ලක්ෂයක් දක්වා ලබාදීම.

(2) මත්ස්‍ය අලෙවිය ප්‍රවර්ධනයට ව්‍යාපෘති ඉදිරිපත් කිරීම.

(3) අතිරික්ත නිෂ්පාදන ගබඩා කිරීම හා කල්තබා ගැනීම සඳහා පහසුකම් ඇති කිරීමට සැළසුම් කිරීම.

(4) විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

(5) කිවුල්දිය හා කලපු ආශ්‍රිත ජලජීවී වගාව ව්‍යාප්ත කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

(6) මත්ස්‍ය කර්මාන්තය ආශ්‍රිත අගය එකතුකල නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.

(7) ධීවර ප්‍රජාව සඳහා පුහුණු වැඩසටහන් සහ සම්මන්ත්‍රණ පැවැත්වීම.

(8) ධීවර ප්‍රජාවගේ සමාජ සුභසාධනය සඳහා ව්‍යාපෘති ඉදිරිපත් කිරීම.

(9) ධීවර කටයුතු සඳහා භාවිතා කරන අමාත්‍යාංශයට අයත් ගොඩනැගිලි ඉදිකිරීම හා සංවර්ධනය කිරීම.

26. ග්‍රාම සංවර්ධන විෂය යටතේ යෝජනා හඳුනාගැනීමේදී හා අනුමත කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(1) පළාත් පාලන බල ප්‍රදේශයක් තුළ පිහිටි පුද්ගලික දේපළක් නොවන නිශ්චිතව හඳුනාගත් කුඩා පාරවල්, ඒ දඬු, කුඩා පාලම් හා බෝක්කු ග්‍රාමීය වෙළෙඳපොළ පහසුකම්, ප්‍රජා ජල ව්‍යාපෘති ඇතුළු ග්‍රාමීය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.

(2) පළාත් සභාවේ විධිමත් ලෙස ලියාපදිංචි වූ ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් බලය පවරනු ලැබූ ග්‍රාම සංවර්ධන නිලධාරියකුගේ නිර්දේශය මත වසර දෙකකට වඩා සක්‍රීයව පවත්වාගෙන යනු ලබන හා දැනට අවශ්‍යතාවයට ප්‍රමාණවත් පරිදි පුටු හා එකලස් කළ හැකි ආවරණ (ජංගම මඩු) නොමැති ග්‍රාම සංවර්ධන සමිති සඳහා රුපියල් ලක්ෂ දෙකක උපරිමයකට යටත්ව එම උපකරණ ලබා දීම.

(3) ග්‍රාමීය මට්ටමේ පිහිටුවා ඇති ස්වේච්ඡා සමිති ඒකරාශී කොට මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම තුළින් ප්‍රජා සංවර්ධනයට අවශ්‍ය ජාලයක් ගොඩනැගීම හා දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීමට කටයුතු කිරීම.

(4) ග්‍රාම සංවර්ධන සමිති ශාලා සඳහා ජලය හා විදුලි පහසුකම් සපයා දීම වෙනුවෙන් රුපියල් හැත්තෑපන් දහසක උපරිමයකට යටත්ව ලබාදිය හැකිය. මෙම ආයෝජනය කළ යුතු වන්නේ ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ නිර්දේශ සහිතව ඉදිරියේ දී මාසික බිල්පත් ගෙවීම සම්බන්ධයෙන් විධිමත් තහවුරුවක් ලබා ගැනීමෙන් අනතුරුවය.

(5) ග්‍රාම සංවර්ධන විෂයය යටතේ ග්‍රාමීය මට්ටමේ තිබෙන පළාත් පාලන මාර්ග සඳහා මාර්ග අමාත්‍යාංශය මුදල් වෙන් කිරීමේ දී, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර අදාළ ක්‍රියාත්මක බලධාරිය විසින් පළාත් පාලන ආයතනයේ එකඟතාවය ලබාගත යුතුය.

(6) පළාත් මැහුම් උපදේශකවරුන් යටතේ සිදු කරන නිෂ්පාදන සඳහා දේශීය/විදේශීය ප්‍රදර්ශන පහසුකම් හා වෙළෙඳපොළ සලසා දීම.

(7) මැහුම් මධ්‍යස්ථාන ආශ්‍රිත පුහුණුලාභීන් නිෂ්පාදන වෙළෙඳපොළට යොමු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම.

(8) මැහුම් කර්මාන්තය සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීම සහ මධ්‍යස්ථානවල උපකරණ ලබාදීම.

(9) ක්ෂුද්‍ර කර්මාන්ත සඳහා අවශ්‍ය පුහුණු, තාක්ෂණය ආදිය ලබාදීම.

(10) ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතාවයන් සඳහා අවකාශ ලබාදීම.

(11) අඩු ආදායම්ලාභී ග්‍රාම සංවර්ධන සමිති සාමාජිකයින්ගේ පවුල්වල පෝෂණය ඉහළ නැංවීම හා ග්‍රාම සංවර්ධන සමිති සාමාජිකත්වයේ මැදිහත් වීම මගින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම.

27. සංචාරක ප්‍රවර්ධනය විෂය යටතේ යෝජනා හඳුනා ගැනීමේ දී හා අනුමත කිරීමේ දී පහත සඳහන් නිර්නායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය :-

(1) පළාත තුළ සංචාරක ආකර්ෂණීය ස්ථානයන් හි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

(2) සංචාරක ආකර්ෂණීය ස්ථාන හා සංචාරක කර්මාන්තය ආශ්‍රිත ප්‍රචාරණ කටයුතු සිදුකිරීම.

(3) සංචාරක ක්ෂේත්‍රය ආශ්‍රිත රැකියා ප්‍රවර්ධනය කිරීම.

(4) සංචාරක ක්ෂේත්‍රය ආශ්‍රිතව වඩාත් ගුණාත්මක සේවාවන් සැපයීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

(5) ජාත්‍යන්තර සංචාරක දිනය සැමරීමට සමගාමීව ක්‍රියාත්මක කරන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(6) සංචාරකයන් ඉලක්ක කර ගෙන නිෂ්පාදනය කරන භාණ්ඩවල ගුණාත්මක බව වැඩි කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම හා අලෙවි ප්‍රවර්ධනය.

(7) පාරිසරික සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

(8) තිරසර ප්‍රජා පාදක සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.

(9) පළාත් සභාවට අයත් නොවන මධ්‍යම රජයේ ඉඩම්වල ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබා දීමේ දී ඉඩම හිමි අදාළ ආයතනයෙන් එකඟතාවය ලබා ගත යුතුය.

28. සත්ත්ව නිෂ්පාදන විෂය යටතේ යෝජනා හඳුනගැනීමේ දී හා අනුමත කිරීමේ දී පහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය :-

(1) මස්, කිරි හා බිත්තර ජනතාවට සැපයීම සඳහා නිරෝගිමත් සත්ත්ව ගහණයක් පවත්වාගෙනයාම.

(2) උසස් වර්ගයේ සතුන් බිහිකිරීමටත්, නිෂ්පාදනය වැඩි කිරීමටත් තාක්ෂණික ක්‍රම යොදාගැනීම හා ගොවීන් අතර ප්‍රචලිත කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම.

(3) සත්ත්ව පාලන ගොවීන්ගේ ආදායම් මට්ටම ඉහළ නංවාලීමට අවශ්‍යවන ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම.

(4) මෙම විෂය සම්බන්ධ යෙදවුම් හෝ සතුන් ඍජු ප්‍රදාන ලෙස ලබා දීමේ දී තාක්ෂණික කමිටුවක නිර්දේශය අනුව ප්‍රතිලාභී දායකත්වය 30%ක් යටතේ උපරිමය රුපියල් පනස් දහසක් ලෙස ලබාදීමට සැලසුම් කිරීම හා ඊට අමතරව පහත සඳහන් කරුණු යටතේ ඍජු ප්‍රදාන ලබාදීමේ දී රජයේ උපරිම දායකත්වය පහත පරිදි ලබාදිය හැකිය.

(i) ගවයන් තුන් දෙනෙකු ගාල් කළ හැකි ගව ගාලක් ඉදි කිරීමට අවම ප්‍රතිලාභී දායකත්වය 30% වන පරිදි රජයේ උපරිම දායකත්වය රුපියල් එක් ලක්ෂ පනස් දහසක් ද වන පරිදි මූල්‍යමය ආධාර හෝ ද්‍රව්‍යමය ආධාර ලබා දිය හැකිය.

(ii) ගවයන් පස් දෙනෙකු ගාල් කිරීමට හැකි ගව ගාලක් ඉදි කිරීමට අවම ප්‍රතිලාභී දායකත්වය 30% වන පරිදි රජයේ උපරිම දායකත්වය රුපියල් ලක්ෂ දෙකක් ද, වන පරිදි මූල්‍යමය ආධාර හෝ ද්‍රව්‍යමය ආධාර ලබා දිය හැකිය.

(iii) එළදෙනෙකු හෝ මී ගව දෙනෙකු මිලදී ගැනීමේ දී අවම ප්‍රතිලාභී දායකත්වය 30% වන පරිදි රජයේ උපරිම දායකත්වය රුපියල් එක් ලක්ෂ පනස් දහසක් ද, වන පරිදි මූල්‍යමය ආධාර හෝ සතුන් ලබා දිය හැකිය.

(5) අගය එකතු කළ නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම.

(6) පරිසර දූෂණය අවම වනසේ සත්ත්ව ගොවිපල පවත්වාගෙන යාම හා අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ක්‍රමවේද සැලසුම් කිරීම යටතේ ඍජු ප්‍රදාන ලෙස ප්‍රතිලාභී දායකත්වය 30% මත ඝන මීටර අටක ජීව වායු ඒකකයක් සඳහා 70% ක රජයේ දායකත්වය මත රුපියල් එක් ලක්ෂ හතළිස් දහසක උපරිමයක් ලබාදිය හැකිය.

(7) කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන. අලෙවි මධ්‍යස්ථාන හා ගබඩා පහසුකම් ඇති කිරීම.

(8) සත්ත්ව පාලන ක්ෂේත්‍රයේ නියුතු ගොවීන් හා නිලධාරීන් සඳහා පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.

(9) කුඩා හා මධ්‍ය පරිමාණයේ පෞද්ගලික සත්ත්ව ගොවිපලවල් ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(10) සත්ත්ව නිෂ්පාදන කටයුතු හා සම්බන්ධ ගොඩනැගිලි ඉදිකිරීම සංවර්ධනය හා ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම.

(11) බස්නාහිර පළාත තුළ ගොවිපල සතුන්ගේ රෝග වැළැක්වීම හා නිවාරණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(12) සත්ත්ව ආහාර නිෂ්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

29. මෙම රීති ක්‍රියාත්මකවන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2190/25 හා 2020 අගෝස්තු මස 25 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයට* ඇතුළත් 2020 අගෝස්තු මස 24 දිනැති බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ සංවර්ධන සැළසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමට අදාළ රීති මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

EOG 10 - 0186

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.